**ගලේවෙල ප්‍රාදේශීය සභාව.**

**--------------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**-------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ගලේවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

තොග අගය කිරීමේ පදනම ගිණුම් සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම් වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට අදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය අතර වසර 13 කට පෙර සිට පවතින රු.1,166,909 ක වෙනස සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සභාවේ ගොඩනැගිලි සංවර්ධන කටයුතු සඳහා දරන ලද රු.1,203,759 ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සභාව සතු සුසාන භූමි 82 කට අයත් අක්කර 112 යි රූඩ් 01 යි පර්චස් 17 ක ඉඩම් ප්‍රමාණය සභාවට පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු කර්මාන්ත ණයගැති ශේෂය රු.262,842 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු. 308,497,465 ක් වූ ගිණුම් විෂයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් අතර රු.125,249,601 ක අසමානතාවයක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.19,983,235 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 07 ක අගය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

-------------------------------------------------

එකතුව රු.165,256,798 ක් වූ ගිණුම් විෂයන් 03 කට අදාළ සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

----------------------------------------------------

පහත විස්තර දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1987 ප්‍රාදේශීය සභා පනතේ 123 වන වගන්තිය | වාහන කුලියට දීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| i. මුදල් රෙගුලාසි 189 | 2004 වර්ෂයේදී ලැබී අහරු වූ රු.47,917 ක චෙක්පතක් සම්බන්ධයෙන් වසර 13 ක් ගතවී ඇතත් කටයුතු කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 570, 571 | වසර 02 ක් ඉක්ම වූ එකතු වටිනාකම රු.1,387,034 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| iii. මුදල් රෙගුලාසි 1645 | සමාලෝචිත වර්ෂයට අදාළව සභාවේ වාහන 19 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2015 ජූලි 14 දිනැති අංක 4/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ | රක්ෂණ පහසුකම් ලබාගැනීමේදී මිල ගණන් කැඳවා ඍජුවම රක්ෂණ පහසුකම් ලබාගත යුතු වුවත් මිල කැඳවීමකින් තොරව රක්ෂණ නියෝජිතයින් මඟින් රු.704,135 ක මුදලකට රක්ෂණ ආවරණ ලබාගෙන තිබුණි. |
| (ඈ) | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය | කඩකාමර බදු කුලී සංශෝධනය වසර 05 කට වරක්වත් කළ යුතු වුවද සභාව සතු කඩ කාමර වලට අදාළ කුලී සංශෝධනය වසර 30 ක පමණ සිට සිදුකර නොතිබුණි. |

1.3.7 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු
------------------------------------------------------------

ගලේවෙල වෙළඳ සංකීර්ණයේ නව ගොඩනැගිල්ලේ අංක 15 කඩ කාමරය සඳහා 2007 කුලී තක්සේරුව රු.6,750 ව තිබියදී 2013 සැප්තැම්බර් 30 දිනැති සභා තීරණයක් මත මාසික කුලිය රු.3,500 ක් බැගින් වනසේ 2013 දෙසැම්බර් 2 දින සිට ගිවිසුම් ගතව තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස වන විට සභාවට රු.120,250 ක කුලී ආදායමක් අහිමි වී තිබුණි.

2 මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,739,367 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,369,664 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,369,703 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වත්කම් බදු දීමේදී වර්ෂ 05 කට වරක් බදුකුලිය සංශෝධනය කර ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අයකර ගැනීම ඉතාම දුර්වල මට්ටමක පැවති අතර, වැඩි වටිනාකමකින් යුතු වරිපනම් ඒකක වලින් පැවති හිඟ ශේෂ අයවී නොතිබුණද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.2.2 වරිපනම්

---------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.1,637,440 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ බිල් කළ වරිපනම් බදු ප්‍රමාණය රු.1,903,676 ක් විය. එයින් 2016 වර්ෂය තුල ලැබී තිබුණේ 47% ක් වන රු.896,529 ක් පමණක් වීමෙන් වරිපනම් බදු අය කිරීමේ දුර්වල ප්‍රගතියක් නිරීක්ෂණය විය.

2.2.3 බදු කුලි

---------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.56,029 ක් වූ හිඟ ශේෂයෙන් වර්ෂය තුළ රු.396 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) වසර 5 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින හිඟහිටි මස් කඩ කුලී රු.84,581 ක් වූ අතර එම ශේෂය නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

----------------

වසර 5 කට අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින හිඟහිටි බලපත්‍ර ගාස්තු රු.691,370 ක් වූ අතර එම ශේෂය නිරවුල් කරගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.106,725 ක් වූ අතර එම ශේෂයට වසරකට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.46,423 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,682,950 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.16,829,167 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කඳුරට සංවර්ධන බැංකුව සඳහා ගොඩනැගිල්ලක් කුලියට ලබාදීම සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) හා (xiv) වගන්තිය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව ගලේවෙල ප්‍රාදේශීය සභාවට අයත් තොග පොල භූමියේ ඇති ගොඩනැගිල්ලක් කඳුරට සංවර්ධන බැංකුවට මාසිකව රු.38,000 ක මුදලකට 2008 වර්ෂයේ සිට 2036 වර්ෂය දක්වා බදු දී තිබුණි. බැංකුව විසින් කරන ලද ඉදිකිරීම වෙනුවෙන් කුලී මුදල් හිලව් කරගත යුතු බවට ගිවිසුමේ දක්වා තිබුණද බැංකුව විසින් අදාළ ඉදිකිරීම් සම්බන්ධයෙන් දරන ලද පිරිවැය සම්බන්ධයෙන් එකඟතාවයක් සභාව සමඟ ඇති කරගෙන නොතිබුණි.

(ii) යථෝක්ත ගොඩනැගිල්ල සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් 08 දිනැති අංක ME/RP/961 ලිපිය මඟින් මාසික තක්සේරු කුලිය රු.70,000 ක් ලෙස දන්වා ඇතත් මාසික බදුකුලිය සංශෝධනය කළ ගාස්තු අයකිරීම් සම්බන්ධ ප්‍රතිපාදන බදු ගිවිසුමේ ඇතුළත් නොකිරීම හේතුවෙන් අදාළ තක්සේරු කුලිය ගෙවීමට කඳුරට සංවර්ධන බැංකුව එකඟ වී නොතිබුණි.

(ආ) සභාව සතු වෙළඳ සංකීර්ණ 6 ක තක්සේරු බදු කුලී අවසන් වරට සංශෝධනය කර වසර 15 කට අධික කාලයක් ගතවී තිබුණද බදුකුලී සංශෝධනය හා බදු ගිවිසුම් අලුත් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) බිම් සවිය කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා සභාව සතු ගොඩනැගිල්ලක් විධිමත් තක්සේරු කිරීමකින් තොරව 2013 අප්‍රේල් 24 දින සිට රු.25,000 ක මාසික කුලියක් මත බදු දී තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 125 හා 126 ප්‍රකාරව පී.එස්.12 ආකෘතියේ සම්මත වැය ලෙජරයක සටහන් කිරීමත්, එක් එක් වැය සම්මත මත වන වියදම් පිළිබඳව හා මාසික වියදම් සාරාංශ සමඟ පරික්ෂා කළ හැකි පරිදි සම්මත වැය ලෙජරය විස්තර සහිතව ලියා දැක්විය යුතු වුවත් වැය ලෙජර මාසිකව තුලනය කර නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

(ආ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ වාහන 9 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් වාහන 5 ක් කුලියට දීම සම්බන්ධයෙන් විධිමත් පරිදි ආදායම් ලේඛන නඩත්තු කර නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු
--------------------------------
2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන නොසලකා ස්ථිර සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය අත්හිටුවීම

මත එම නිලධාරීන් සභාවට විරුද්ධව නඩු පවරා තිබුණි. මේ සඳහා සභා අරමුදලින් නීතිඥ ගාස්තු ලෙස රු.300,000 ක් දරා තිබුණි.

3.4 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු රු.3,000,000 ක් වටිනා ගලිබවුසරයක් හා රු.79,000 ක් වටිනාකම වූ කුබෝටා අත්ට්‍රැක්ටරයක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

(ආ) සණ අපද්‍රව්‍ය ටේලරයක් සහ ට්‍රැක්ටර් ටේලරයක් වසරකට වඩා කාලයක් භාවිතයට නොගන්නා අතර මේවා අලුත්වැඩියා කර ප්‍රායෝජනයට ගැනීමට හෝ ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

සභා වාහන වල ආදායම් බලපත්‍ර නියමිත දින වකවානු වල ලබා නොගැනීම හේතුවෙන් දඩ මුදල් වශයෙන් රු.31,230 ක් හා ප්‍රමාද ගාස්තු ලෙස රු.4,435 ක්ද ගෙවා තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පංගල පාරේ සිට බුලනවැවට යන අතුරු මාර්ගය සංවර්ධනය කිරිම.

------------------------------------------------------------------------

පොදු අරමුදල් යටතේ මෙම මාර්ගය 2016 වර්ෂයේදී රු.500,000 ක් වැය කර කොන්ක්‍රීට් කර තිබූ අතර මාර්ගයේ දෙපස කොන්ක්‍රීට් තීරුව සමඟ කොන්ක්‍රීට් ගල් ඇතිරූ කොටස සවි වී නොතිබූ බවත්, මාර්ගයේ දෙපස පිපිරීම් තිබූ බවත්, භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ගලේවෙල බස් නැවතුම්පොල සඳහා බොරළු සැපයීම.

----------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) පොදු අරමුදල් මඟින් ගලේවෙල බස් නැවතුම්පොල භූමියට බොරළු සැපයීම රු.228,195 කට ඇස්තමේන්තු කර සෘජු ශ්‍රම පදනම මත ඉටු කර තිබුණි. මෙහිදී බස් නැවතුම්පොලෙහි නිවැරදි මිනුම් වාර්තා ලබාගෙන ඇස්තමේන්තු කර නොතිබීම නිසා බොරළු කියුබ් 52 ක් සඳහා කියුබ් එකකට රු.1,050 බැගින් රු.54,600 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) බොරළු සැපයුම් කරුවකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් මණ්ඩලය රැස්වී තීරණය කර තිබුණේ 2016 පෙබරවාරි 19 දින වුවද 2016 ජනවාරි 26 දින සිට බොරළු ප්‍රවාහනය කිරීමට කටයුතු කර තිබුණි.

(ඇ) ගලේවෙල සතිපොල අලුත්වැඩියාව හා අලුතින් කොටසක් එකතු කිරීම

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ගලේවෙල සතිපොල සංවර්ධනය කිරීම සඳහා මහවෙල යාය ගොවි සංවිධානය සමඟ 2015 ඔක්තෝබර් 30 දින ගිවිසුම් ගතව වැඩ නිම කිරීමෙන් පසුව රු.966,074 ක් කොන්ත්‍රාත්කාර සමිතියට ගෙවා තිබුණි. එහිදී වැඩ විෂය අංක 12 ට අනුව පොළව කොන්ක්‍රීට් කර කපරාරු කිරීම සඳහා වර්ග මීටර් 43.16 ක් සඳහා වර්ග මීටරයකට රු.1,223 බැගින් රු.52,784 ක් ගෙවා තිබුණි. එකී වැඩ විෂය යටතේ ඉටුකරන ලද කොටස සහ කොන්ක්‍රීට් සහ කපරාරුව නියමිත ප්‍රමිතියකින් තොර බව ස්ථානීය පරික්ෂාවේදී නිරීක්ෂණය විය.

3.7 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

පළාත් සභා මන්ත්‍රී ආධාර යටතේ නිවාස ඉදිකිරීම් සඳහා ද්‍රව්‍ය ආධාර ලබාදී තිබූ ප්‍රතිලාභීන් දෙදෙනෙකු එම ද්‍රව්‍ය හා ආධාර ඵලදායී ලෙස යොදාගෙන ව්‍යාපෘති සම්පූර්ණ කර නොතිබුණි.

3.8 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

මධ්‍යම පළාතේ පළාත් පාලන අමාත්‍යාංශය රුපියල් මිලියන 3 ක ආධාර යටතේ 2010 වර්ෂයේදී ආවරණ සහිත කසල බැහැර කිරීමේ කාණු 2 ක් (100"x25") හා කසළ තේරීම සඳහා අංගනයක් සහිත ස්ථානයක් ඉදිකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදීද රු.212,556 ක් වැය කර අළුත්වැඩියා කටයුතු සිදුකර තිබුණි. පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රාදේශයේ දෛනිකව එකතු වන මෙට්‍රික් ටොන් 2.5 පමණ කසළ වලින් දිරන අපද්‍රව්‍ය කාණු පද්ධතියට යොමු කර තිබුණද, එම කාණු වල කසළ දිරාපත්වීමේ ක්‍රියාවලිය නිසි අයුරින් සිදු නොවන බව දක්නට ලැබුණි.

(ආ) අපද්‍රව්‍ය කාණු පද්ධතියට එකතු කිරීමේදී නොදිරන අපද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම ඉවත් කර කාණු පද්ධතියට එකතු කිරීමක් කර නොතිබුණි.

(ඇ) මල අපද්‍රව්‍ය බැහැර කිරීමට සුදුසු ස්ථානයක් සභාව විසින් හඳුනාගෙන නොතිබුණි.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 50 ක් සඳහා ඇති කළ රු.4,868,500 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) වැය විෂයයන් 30 ක් සඳහා ඇති කළ ප්‍රතිපාදන වලින් රු.7,096,500 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම සිදු කර තිබුණි.

(ඇ) වැය විෂයයන් 115 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර 9% සිට 100% දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

-----------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම.

---------------------------------------------------------

2016 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක CPC/CLG/1/9/14 දරන ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

5 පද්ධති හා පාලනය

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් පාලනය

(ආ) වාහන පාලනය

(ඇ) ණයගැති හා ණයහිමි පාලනය

(ඈ) කාර්ය මණ්ඩල කළමනාකරණය

(ඉ) ආදායම් පාලනය